**හම්බන්තොට මහා නගර සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**---------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 11 දින ද නගරාධිපති ඇතුළු සභිකවරුන්ට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**----------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**----------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 340,805 ක් වූ සේවක ඇප හා සේවක ඇප ආයෝජන මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | මෙමගින් සභාවට සෘජු ප්‍රතිලාභයක් නොමැති බැවින් සටහනක් මගින් හෙළිදරව් කරන ලදී |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. 234,777 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 මූල්‍ය ප්‍රකාශන සැසඳීමේදී වරද නිවැරදි කිරීමට කටයුතු කරමි |

**(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 1,016,035ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරිපත් කළ හැකි තොරතුරු ඉදිරියේදී ඉදිරිපත් කරන අතර රජයේ ප්‍රාග්ධන ආධාර හා සංවර්ධන සංචිත වලට අදාළව විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමට කිසිදු තොරතුරක් සභාව සතුව නැත. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මුදල් රෙගුලාසි 371(5) | වටිනාකම රු. 74,270 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාළ කර්මාන්ත සඳහා රැඳවුම් මුදල් ලැබුණු පසු අත්තිකාරම් පියවා ගැනීමට නියමිත අතර මාළු වෙළඳපොළ ජල බිල්පත් හා මාසික ගාස්තු අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලදී. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | වසර 02 ඉක්මවූ වටිනාකම රු. 242,217 ක් වූ තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 ජනවාරි 30 දින ලබා ගත් මුදල් කමිටු තීරණය පරිදි 2019 පෙබරවාරි 21 දිනැති අංක 54 දරන වවුචරය මගින් ටෙන්ඩර් තැන්පත් රු. 145,500 ක් හා මිශ්‍ර තැන්පත් රු. 177,695 ක් සභා ආදායමට ගන්නා ලදී |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාවේ වාහන 06 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු | ඉන්ධන පරීක්ෂාවන් කඩිනමින් සිදු කරමි |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/1 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 ඡේදය | කඩ කාමර 62 ක ගිවිසුම් වසර 03 කට වරක් යාවත්කාලීන කර නොතිබුණි. | කළ යුතුවේ. | අදාළ ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරන අතර, තිස්ස පාර කඩ කාමර ගැණුම්කරුවන් නව තක්සේරු වාර්තාවට අනුව බදු මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කර ඇති නිසා ඒවා නැවත පවරා ගැනීමට කටයුතු කරමි. රුහුණු ප්ලාසා කඩ කාමර තක්සේරුව සඳහා විෂයභාර ඇමතිතුමාගේ අනුමැතිය මේ වන විටත් ලැබී නැත. |
| (ඈ) | 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශ චක්‍රලේඛය | වීථි පහන් සඳහා දැරූ රු. 1,768,148 ක වියදමින් සියයට 89 ක් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වීථි පහන් නඩත්තු කටයුතු වෙනුවෙන් ප්‍රතිපූර්ණය කරනු ලබන මුදල සංශෝධනය කර ගෙවන මෙන් විදුලි ඉංජිනේරු 2018 අප්‍රේල් 20 දින දැනුවත් කරන ලදී |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 1,198,539 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,179,128 ක් විය .

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,627,613 | 6,086,497 | 4,377,135 | 1,919,022 | 6,877,000 | 7,166,642 | 6,028,788 | 2,050,078 |
| කුලී | 14,909,185 | 15,237,900 | 4,753,682 | 459,282 | 15,421,000 | 18,598,220 | 18,347,680 | 545,273 |
| බලපත්‍ර ගාස්තු | 5,053,000 | 4,214,873 | 4,061,123 | 149,500 | 2,492,000 | 4,117,732 | 4,005,995 | 584,950 |
| වෙනත් ආදායම් | 10,798,000 | 9,580,086 | 17,123,628 | 4,298,160 | 7,552,000 | 7,187,906 | 4,885,463 | 3,491,917 |
| එකතුව | 36,387,798 | 35,119,356 | 30,315,568 | 6,825,964 | 32,342,000 | 37,070,500 | 33,267,926 | 6,672,218 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ මුළු ආදායම රු. 6,672,218 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු. 35,119,356 ක් විය. මේ අනුව වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු. 41,791,574 ක් වුවද රැස්කළ ආදායම රු. 30,315,568 ක් වීමෙන් ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 73 ක් ව පැවතුණි. වර්ෂය අවසානයට තවදුරටත් අයවිය යුතු මුළු හිඟ ආදායම රු. 6,825,964 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | 2018 වර්ෂයේ මුළු අය කිරීම් හිඟත් සමඟ රු. 34,657,021 ක් වූයෙන් ප්‍රගතිය සියයට 82 කි |

**2.2.3 වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ වරිපනම් හා බදු ආදායම රු. 2,050,078 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු. 6,086,497 ක් විය. මේ අනුව වර්ෂය තුළ අයවිය යුතු වරිපනම් හා බදු ආදායම රු. 8,136575 ක් වුවද, රැස්කළ ආදායම රු. 4,377,135 ක් වීමෙන්, වරිපනම් හා බදු ආදායම රැස් කිරීමේ ප්‍රගතිය සියයට 54 ක මට්ටමක පැවතුණි | වරිපනම් රැස් කිරීමේ ප්‍රගතිය ඉහළ නංවාගත යුතුවේ. | 2018 වර්ෂයේ වරිපනම් හා බදු රැස් කිරීමේ ප්‍රගතිය සියයට 76 කි |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් හා බදු රු. 1,919,022 ක් වූ අතර, මහා නගර සභා ආඥා පනතේ 252(1) වගන්තිය ප්‍රකාරව එම හිඟයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද හිඟ ශේෂය තුළ වසර 02 ත් 05 ත් අතර ශේෂය රු. 995,127 ක්ද වසර 05 ට වැඩි ශේෂය රු. 119,358 ක් විය | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | හිඟයෙන් රු. 313,027 ක් 2019 මැයි 24 දිනට අයකර ගත් අතර, රු. 191,206 ක් කපා හැර ඇත. ඉතිරිය අයකර ගැනීම සඳහා ක්ෂේත්‍රයේ ගොස් හිඟ අය කිරීමේ රතු නිවේදන බෙදා හැරීම හා දේපල තහනම් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමි |

**2.2.4 කුලී**

**----**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | -------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කළ කුලී ආදායම රු. 15,237,900 ක් වූ අතර, රැස්කළ ආදායම රු. 4,753,682 ක් විය. මේ අනුව බිල් කළ ආදායමට වඩා රැස්කළ ආදායම රු. 10,484,218 ක් අඩු වී තිබුණු අතර අඩු වීමේ ප්‍රතිශතය සියයට 69 ක් විය. | කුලී රැස් කිරීමේ ප්‍රගතිය වර්ධනය කරගත යුතුවේ . | කුලී වලට අදාළ බදුකුලී හා ටෙන්ඩර් කුලී වැරදීමකින් වෙනත් ආදායම් යටතේ දක්වා ඇති නිසා එය නිවැරදි කළ පසු ප්‍රගතිය සියයට 98 කි |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කඩ කුලී රු. 260,070 ක ශේෂය තුළ වර්ෂ 03 ත් 05 ත් අතර හිඟ හිටි ශේෂය රු. 174,815 ක් විය. | හිඟ කුලී අයකර ගත යුතුවේ. | රු. 78,850 ක් අයකර ගත් අතර ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි |

**2.2.5 බලපත්‍ර ගාස්තු**

**-----------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ----------- | ---------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත බලපත්‍ර ගාස්තු ආදායම රු. 5,053,000 ක් වූ අතර, බිල්කළ ආදායම රු. 4,214,873 ක් විය. මේ අනුව ඇස්තමේන්තුගත ආදායමින් සියයට 83 ක් පමණක් බිල්කිරීම් කර තිබුණි. | ඇස්තමේන්තු නිවැරදිව සැකසිය යුතුවේ. | ප්‍රවර්ථන වර්ෂයේ බිල්කළ ආදායමින් සියයට 96 ක් රැස්කර ගන්නා ලදී |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට ලැබිය යුතු බලපත්‍ර ගාස්තු රු. 149,500 ක ශේෂය තුළ වර්ෂ 02 ත් 03 ත් අතර හිඟ හිටි ශේෂය රු. 51,500 ක් විය. | හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී හිඟයෙන් රු. 10,000 ක් අයකර ගෙන ඇති අතර ඉතිරිය අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලදී |

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | ------------------------------ |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 182,977 ක් හා රු. 3,362,135 ක් විය. ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය තුළ වර්ෂ 02ත් 03ත් අතර හිඟ ශේෂය රු. 1,132,635 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු වලින් රු. 2,429,032 ක් අයවී ඇති අතර ඉතිරිය අයකර ගැනීමට කටයුුතු කරමි |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් වටිනාකම රු . 7,634,269ක් වූ කර්මාන්ත 05 ක් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි. | අයවැය ලේඛනයෙහි ඇතුළත් කර ඇති සංවර්ධන යෝජනා ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ. | අදාළ කර්මාන්ත ඉටු කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට පළාත් පාලන අමාත්‍යංශයට හා පළාත් පාලන දෙපාර්තමේන්තුවට ඇස්තමේන්තු ඉදිරිපත් කළත් ඒ සඳහා අරමුදල් නොලැබීමත්, මෙම යෝජනා සඳහා විශාල මුදලක් වැය වන නිසා සහා අරමුදලින් ඉටු නොකරන ලදී |

#### (ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2019 වර්ෂයේ සිට සකස් කිරීමට කටයුතු කරමි |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව මැතිවරණ කොමසාරිස්ගෙන් සත්‍ය වියදමට වඩා වැඩියෙන් ප්‍රතිපූර්ණය කරගත් මුදල රු 54,881 .ක් විය. | සත්‍ය වියදම ප්‍රතිපූර්ණය කළ යුතුවේ. | ඡන්ද විමසීමට අදාළව සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා සැපයීම හා ජලය, ඉන්ධන වියදම් සඳහා මුදල් සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලයෙන් නියමිත පරිදි ප්‍රතිපූර්ණය කර ගෙන ඇති අතර එම මුදලින් වියදම් පියවූ පසු ඉතිරි වී ඇති මෙම මුදල මිශ්‍ර තැන්පතුවක් ලෙස ඉදිරියට ගෙන යන ලදී |
| (ආ) 2010දෙසැම්බර් 27දිනැති අංක දපපා/පපාකො/ 01/2010දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 03ඡේදය ප්‍රකාරව සභාව සතු කඩ කාමර 52 ක් සම්බන්ධයෙන් නව තක්සේරු කුලිය අයකිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු කුලිය අය කිරීමට කටයුතු කළ යුතුවේ. | අදාළ ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරන අතර තිස්සපාර කඩ කාමර ගැණුම්කරුවන් නව තක්සේරු වාර්තාවට අනුව බදු මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කර ඇති නිසා ඒවා නැවත පවරා ගැනීමට කටයුතු කරමි. රුහුණු ප්ලාසා කඩ කාමර තක්සේරුව සඳහා විෂයභාර ඇමතිතුමාගේ අනුමැතිය මේ වන විටත් ලැබී නැත. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් මහා නගර සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 38 ක වටිනාකම තක්සේරු කර නොතිබුණි | වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය පැවැත් වීමෙන් පසුව එම ඉඩම්වල හිමිකම හා මායිම්වල නිරවුල් බව හඳුනා ගැනීමට කටයුතු කරන අතර, ඉන් පසුව එම දේපල සඳහා තක්සේරුගත වටිනාකම් ඇතුළත් කිරීමට බලාපොරොත්තු වෙමි |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 35 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 01 ක්වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | පුරප්පාඩු 21 ක් සම්පූර්ණ කිරීම දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් සිදු කරන අතර 2019 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පුරප්පාඩු 14 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කරමි |
| (ආ) මහා නගර සභාවේ නිලධාරීන් 05 දෙනෙකු අනුමත රාජකාරි වලින් බැහැර වෙනත් රාජකාරිවල යොදවා තිබුණි. | අනුමත රාජකාරිවල යෙදවිය යුතුවේ. | දකුණු පළාත් ආණ්ඩුකාරතුමිය විසින් 2013 අප්‍රේල් 16 දින අනුමත කරන ලද නව සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව කාර්යාල, පුස්තකාල, ගබඩා, ජල හා අගුල් කම්කරු යන තනතුරු නාමයන් වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුරට අන්තර්ග්‍රහණය |

| | | | |
|---|---|---|---|
| | | | කර ඇති නිසා කාර්යාල හා ගබඩා කම්කරු තනතුරු වල යොදවන ලදී |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සේවය හැරගිය සේවකයින් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු . 87,750ක් වූ ණය/අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මිලදී ගත් කළමනාකරණ තොරතුරු පද්ධති 10අතුරින් ගිණුම් හා ගෙවීම් පද්ධතිය සහ මාර්ගස්ථ සේවා හා ගෙවීම් කළමනාකරණ පද්ධති 02 ක් මුල් අවධි මට්ටමක පැවතීමත් එම පද්ධතීන් නවීකරණය කර ගැනීමට කටයුතු නොකිරීමත් නිසා ඒ සඳහා දැරූ රු. 326,500 ක වියදම අනාර්ථික ගනුදෙනුවක් වී තිබුණි. මෙම පද්ධතිය මිලදී ගෙන වසර 02ක් ගත වුවද සර්වරයක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම පද්ධති ප්‍රශස්ථ ක්‍රියාකාරී මට්ටමක පවත්වාගත යුතුවේ. | තොරතුරු පද්ධතියේ වැඩිදියුණු කිරීම් තවදුරටත් ආයතනික නිලධාරීන්ගේ යෝජනා මත සිදු කරමින් පවතින අතර මාර්ග ගත ගෙවීම් සඳහා වන තොරතුරු පද්ධතිය සකස් කර අවසන් බැවින් ගෙවීම් සිදු කර ඇත. ගිණුම් හා ගෙවීම් පද්ධතියද සකස් කර පද්ධතියට ඇතුළත් කර ඇති අතර, අදාළ විෂය හා සම්බන්ධ නිලධාරීන් අඩුකම හා කාර්ය බහුලතාවය නිසා දත්ත ඇතුළු කිරීමේ ප්‍රමාදයක් සිදු වී ඇති බැවින් ඒවා කඩිනමින් ඇතුළත් කිරීමට කටයුතු කරමි. සර්වරය සම්බන්ධයෙන් ඉදිරියේදී අදාළ සේවාවන් ICT ආයතනය මගින් ලබා ගැනීමට කටයුතු කරමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් මහා නගර සභාව භුක්ති විඳින ඉඩම් 42 ක සහ වාහන 06 ක ලියාපදිංචි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙම වාහනවල අයිතිය ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් පවරා ගැනීමට කටයුතු කරමි. |

### 3.5.2 වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මගින් හඳුනා ගත් භාණ්ඩ 21 කට අදාළ නිර්දේශයන් 2019 මැයි 22 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 ජුනි 11 දිනැති ලිපිය පරිදි භාණ්ඩ 21 න් භාණ්ඩ 18 ක් 2018 වර්ෂයේ අලුත්වැඩියා කළ අතර, භාණ්ඩ වර්ග 02 කට අදාළ අලුත්වැඩියාවන් සිදු කිරීමට නියමිත බව සහ එක් භාණ්ඩයක් අලුත්වැඩියාව සඳහා අවශ්‍ය උපාංග මිලදී ගැනීමට නොහැකි නිසා අලුත්වැඩියාව සිදු නොකරන ලදී |

### 3.6 ප්‍රසම්පාදනය

### 3.61. කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දින දීර්ඝයක් ලබා නොදුන් බස් නැවතුම්පොළ ඉදිරිපිට GI බට සවි කිරීමේ කර්මාන්තයේ ගිවිසුම ප්‍රකාරව 2018අගෝස්තු 18දින වැඩ අවසන් කළ යුතු වුවත් ,කාර්මික නිලධාරිගේ නිමි වැඩ වාර්තාව අනුව වැඩ අවසන් කළ දිනය 2018දෙසැම්බර් 28 වූයෙන් ප්‍රමාද දින 132ක් සඳහා රු 39,450 .ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි | ගිවිසුම් කාලය තුළ කර්මාන්තවල වැඩ අවසන් කළ යුතුවේ. | ප්‍රමාද ගාස්තු සමිතියේ බිල්පත් පියවීමේදී අය කිරීමට කටයුතු කරන අතර අදාළ අඩු කිරීම්වල තොරතුරු කඩිනමින් විගණනය වෙත යොමු කරමි |
| (ආ) | දකුණු පළාත් ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ හම්බන්තොට නගර සභා ක්‍රිඩාංගනය සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාළව අනුමත කළ ගෙවීම් භෞතිකව පරීක්ෂාවේදී රු 80,330 .ක් වැඩිපුර අනුමත කර තිබුණි. | කළ වැඩ වාර්තාව පරිදි ගෙවීම් කළ යුතුවේ | වැඩිපුර අනුමත කර ඇති මුදල අයකර ගැනීමට කටයුතු කරමි |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වියදම් විෂයයන් 02 ක එකතුව රු. 16,903,875 ක් වූ ඉතිරිවීම් පැවති අතර එය සියයට 11 සිට සියයට 18 ක පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතුවේ. | නිසි අධ්‍යානයකින් හා ඇගයීමකින් යුතුව හැකිතාක් දුරට තථ්‍ය අගයන්වලට ගැලපෙන පරිදි ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරමි |
| (ආ) | වියදම් විෂයයන් 05 කට අදාලව අයවැයගත සීමාව ඉක්මවා රු. 5,821,718 ක වියදම් දරා තිබුණු අතර එය සියයට 20 සිට සියයට 75 දක්වා පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතුවේ. | නිසි අධ්‍යානයකින් හා ඇගයීමකින් යුතුව හැකිතාක් දුරට තථ්‍ය අගයන්වලට ගැලපෙන පරිදි ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරමි |